# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1465/19 – 2006 ඔක්තෝබර් 05 වැනි බ්‍රහස්පතින්දා – 2006.10.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

### 3 වන වගන්තිය යටතේ නියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝග මගින් ;

(අ) මෙහි උපලේඛනයේ I තීරුවේ යම් සටහනක දැක්වෙන යම් විශේෂිත සාධන පත්‍රයක් මත එම උපලේඛනයේ II තීරුවේ අනුරූපව සටහනේ දක්වා ඇති අනුප්‍රමාණයන්ට අනුව 2006.10.06 දින සිට ක්‍රියාත්මක වනසේ මුද්දර ගාස්තු අය කල යුතු යයි නියම කරමි.

(ආ) එම වගන්තිය යටතේ පනවන ලද 2006 අප්‍රේල් 03 වැනි දින සහ අංක 1439/1 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලදුව 2006 අප්‍රේල් 20 වැනි දින සහ අංක 1441/17 දරන *ගැසට් නිවේදනය* මගින් එම වගන්තිය යටතේ සංශෝධිත නියෝග, 2006.10.06 දින සිට බලපැවැත්වෙන පරිදි පරිච්ඡින්න කරමි.

මහින්ද රාජපක්ෂ,  
ජනාධිපති,  
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2006 ඔක්තෝබර් මස 05 වැනි දින.  
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,  
කොළඹ 01.

### උපලේඛනය

| *අයිතම අංකය* | *I තීරුව* | *II තීරුව රුපියල් ශත* |
|---|---|---|
| 1. | යම් දිවුරුම් පෙත්සමක් | 25.00 |
| 2. | රක්ෂණ ඔප්පුවක් | |
| | ඔප්පුව මත ගෙවිය යුතු මුළු වාරික මුදලෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | 0.50 |
| 3. | ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස ක්‍රියා කිරීමට බලපත්‍රය | 1,000.00 |

| අයිතම අංකය | I තීරුව | II තීරුව රුපියල් |
|---|---|---|
| 4. | යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් කරගෙන යාමට නිකුත් කළ බලපත්‍රයක් - බලපත්‍රයෙහි සඳහන් යම් කාලපරිච්ඡේදයක් සඳහා | 1,000.00 හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන අගයන් දෙකෙන් අඩු මුදල |
| 5. | යම් කාලපරිච්ඡේදයක් තුළ ණය කාඩ්පතක් (ක්‍රෙඩිට් කාඩ්) භාවිතා කරමින් ඇතුළත් වූ ගනුදෙනුවක් සඳහා ගෙවිය යුතු වන, මූල්‍ය හෝ සේවා ගාස්තු අඩංගු නොවන යම් මුදල් ප්‍රමාණයක් සඳහා හිමිකම් පෑමක්, ඉල්ලීමක් හෝ අයැදීමක් | |
| | එම මුදලෙහි සෑම රු. 1,000 හෝ ඉන් කොටසක් සඳහා | 10.00 |
| 6. | යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත, නිකුත් කළ යම් කොටස් සහතිකයක් | |
| | එවැනි කොටස්වල මුළු වටිනාකමෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | 5.00 |
| 7. | යම් දේපොලකට බලපාන යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් සඳහා උකස් කිරීමක් | |
| | එහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසකට | 1.00 |
| 8. | යම් පොරොන්දු නෝට්ටුවක් | |
| | එහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | 1.00 |
| 9. | යම් දේපොලක් බද්දට හෝ කුලියට දීමට අදාළ යම් සාධන පත්‍රයක් | |
| | (අ) කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුම (කුලී සින්නක්කර ගිවිසුම් හැරුණු කොට) සමන්විත මුළු කාලපරිච්ඡේදය සඳහා යම් අධි මිල ද ඇතුළුව එකතු කල් බද්ද හෝ කුලිය - එහි සෑම රු. 1,000 හෝ ඉන් කොටසක් සඳහා | 10.00 |
| | එසේ වුවද කල් බද්දේ හෝ කුලියේ කාලපරිච්ඡේදය වසර 20 ඉක්මවන විට කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුම සමන්විත කාලපරිච්ඡේදය සඳහා එකතු කල් බද්ද හෝ කුලිය. කල් බදු ගිවිසුම හෝ කුලී ගිවිසුමෙහි පළමු වසර 20 සඳහා වන කල් බද්ද හෝ කුලිය ලෙස සලකනු ලැබිය යුතුයි. | |
| | (ආ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ එළඹ ඇති කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ගෙවිය යුතු මුළු වටිනාකමෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | 10.00 |
| 10. | ලදුපතක් හෝ නිදහස් කිරීමක් | |
| | (අ) යම් මුදලක් හෝ වෙනත් දේපොලක් සඳහා දෙන ලද (මෙහි (ආ) ඡේදයේ සඳහන් පාරිශ්‍රමිකය නොවන මුදලක) රු. 1,000 ට සමාන හෝ ඊට වැඩි නමුත් රු. 50,000 ට අඩු මුදල් ප්‍රමාණය මත සෑම රුපියල් 1,000 හෝ ඉන් කොටසකට | 1.00 |
| | රු. 50,000 හෝ ඊට වැඩි මුදල් ප්‍රමාණය මත | 50.00 |
| | (ආ) සේවා නියුක්තිකයන් සඳහා ගෙවනු ලබන දළ පාරිශ්‍රමිකය | |
| | රු. 25,000 ට වැඩි නමුත් රු. 40,000 ට අඩු | 25.00 |
| | රු. 40,000 ට වැඩි නමුත් රු. 50,000 ට අඩු | 40.00 |
| | රු. 50,000 හෝ ඊට වැඩි | 50.00 |

10-488

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.